# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)

# වීඩියෝ වාර්තා චිත්‍රපට තුනක් නිෂ්පාදනය කිරීම

01. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය (MoMDE) සහ තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යාංශයේ (MOSDW) සහයෝගිතාවයෙන් ව්‍යාප්ති කළමනාකරණ ඒකකයක් (PMU) තුළින් ජෛව පරිසර පද්ධති සංරක්ෂණ ව්‍යාපෘතිය (ESCAMP) ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව (FD) හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC) විසිනි.

ESCAMP ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින්, ESCAMP ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘති ක්‍රියාකාරකම්, ඒවායේ සාර්ථකත්වය, තිරසරභාවය හා ප්‍රත්‍යක්ෂභාවය පිළිබඳව සිය පාර්ශවකරුවන්හට හා මහජනතාවට අවබෝධයක් ලබාදීමට අපේක්ෂා කරයි. මෙම පැවරුමේ සමස්ත අරමුණ වනුයේ පහත සඳහන් ESCAMP ව්‍යාපෘතිය ආශ්‍රිත සිරස්තල උද්දීපනය කොට පෙන්වීම සඳහා විකාශය කිරීමට සුදුසු තත්වයේ, විනාඩි 12-13 කාලයක, උසස් තත්වයේ වෙන් වශයෙන් වූ විඩියෝ වාර්තාමය කෙටි චිත්‍රපටි තුනක් අධ්‍යක්ෂණය කොට නිෂ්පාදනය කිරීමය. අදාළ වාර්තාමය කෙටි චිත්‍රපටි, ශ්‍රී ලංකාවේ තෝරාගත් පරිසර පද්ධතිවලට අදාළව ESCAMP ව්‍යාපෘතිය මගින් සැලසුම්ගත ව්‍යාපෘති මැදිහත්වීම් හා ප්‍රවේශයන් අවබෝධ කරගනිමින් ප්‍රමුඛ අරමුණුගත කණ්ඩායම් වෙත ප්‍රතිඵලදායී ලෙස සංනිවේදනය කිරීම අපේක්ෂා කෙරේ. මෙම අරමුණ නිදර්ශනය කිරීම සඳහා www.escamp.lk වෙබ් අඩවියෙහි සඳහන් සංකල්ප සටහන් හා යොමු කිරීමේ අනුදේශ (TOR) ප්‍රකාරව පහත සඳහන් විෂයන් මත අදාළ වාර්තාමය චිත්‍රපටි නිෂ්පාදනය කිරීමට යෝජනා කෙරේ.

අ) පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණ ව්‍යාපෘති සංකල්ප පිළිබඳව කෙටි හැඳින්වීමක්.

ආ) නියමු භූ දර්ශන සැලසුම් සැකසීම හා කළමනාකරණය.

ඇ) ජීවනෝපාය සුරක්ෂිත කිරීම සඳහා අලි – මිනිස් සහජීවනය.

02. ඒ අනුව ESCAMP ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින්, සුදුසුකම්ලත් හා පළපුරුදු ආයතන/ සමාගම් / වෘත්තිකයන්හට මෙම පැවරුම භාරගෙන කටයුතු කිරීම සඳහා ආරාධනා කෙරේ. උනන්දුවක් දක්වන සමාගම්/ ආයතන / වෘත්තිකයන් විසින්, www.escamp.lk වෙබ් අඩවියෙහි සඳහන් යොමු කිරීමේ අනුදේශ (TOR) සඳහා යොමු වෙමින් තමන් මෙම කාර්යය ඉටුකිරීමට සුදුසුකම් සහිත බව සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළයුතු අතර, ඒ සඳහා එක් පිටුවක උනන්දුව ප්‍රකාශ කිරීමේ ලිපියක්, කෙටි තාක්ෂණ යෝජනා (අරමුණු, විධික්‍රම හා ප්‍රවේශයන් වෙත නැඹුරුව උපරිම පිටු තුනක) සියලු පිරිවැය ඇතුළත් වූ අයවැයක් වාර්තා චිත්‍රපටිකරණයෙහි නියැලී වෘත්තිකයන්ගේ යාවත්කාලීන කළ ජීව දත්ත හා සේවා සපයන්නා විසින් මෑතකදී නිෂ්පාදනය කළ උසස් තත්ත්වයේ වාර්තා චිත්‍රපටි දෙකක් හෝ තුනක් අප වෙත ලැබීමට සලස්වන්න.

03. වඩාත්ම සුදුසු නිපුණතාවලින් යුත් සමාගම/ ආයතනය හෝ වෘත්තිකයන් තෝරා ගැනීම, ලෝක බැංකු මාර්ගෝපදේශ හා යොමු කිරීමේ අනුදේශයන්හි නියමිත ක්‍රියාපටිපාටිය තුළින් සිදු කෙරේ. (ESCAMP ව්‍යාපෘති තාක්ෂණ ඇගයුම් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.)

04. යෝජනා හා අදාළ ලේඛන, පහත සඳහන් ලිපිනයට 2018 ජූලි 02 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, " ESCAMP ව්‍යාපෘතිය සඳහා විඩියෝ වාර්තා චිත්‍රපටි සඳහා යෝජනා" යනුවෙන් සඳහන් කළ යුතුය.

විස්තර සඳහා www.escamp.lk වෙබ් අඩවිය වෙත යොමුවන්න. වැඩිදුර විස්තර සඳහා, රාජකාරී දිනවල, 0900 පැය හා 1600 පැය අතර, කාලය තුළ. දුරකථන අංක 011-2888426 මගින් සන්නිවේදන විශේෂඥ අමතන්න.

අදාළ ඉදිරිපත් කිරීම්, පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතුවේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP)**
**ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,**
**අංක 82, "සම්පත්යාය",**
**රජමල්වත්ත පාර, බත්තරමුල්ල.**